පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සබරගමුව

සති පාසල

විෂය-පෙරදිග සංගීතය

ජූලි මාසය

ශ්‍රේණිය-9

1 - සතිය

1.පාඩම හෝ ඒකකය- Clef , Rest Mark ,Tie

2.නිපුණතාවය 8.0 -සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

3.නිපුණතා මට්ටම 8.1 - බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

4.පෙර ඉගෙනුම් අවස්ථා/ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :

- බටහිර සංගීතය ප්‍රස්තාර කිරීම යන පාඩම මතක් කර ගැනීමට පහත link එක ඔස්සේ සම්බන්ධ වන්න.
  https://youtu.be/PO0l3-Pukbg?list=PLQX7SVzJRMEyWeForMF46PN133BmstojH
- ඔබ 9 ශ්‍රේණියට නියමිත Sharps,Flat,Natural Marks අධ්‍යයනය කර ගත හැකි පොත්පත්,Web Site , LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක පහත link ඔස්සේ නරඹන්න.
  - eනැණපියස:
    Interactive Lesson
    https://www.enenapiyasa.lk/lms/mod/h5pactivity/view.php?id=13116
  - eතක්සලාව : -
  - Youtube :

1. https://youtu.be/VaNEPLch9v0
2. https://youtu.be/1y0nh_-TJlo?list=PLQX7SVzJRMEykqp1u1-SvbkxIRW-DAsER

අතිරේක පොත්/සඟරා :

1.අතිරේක කියවීම් පොත- පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
2.ජානක බණ්ඩාර ජයලත් - පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
3. සංගීත අධ්‍යයනය-ගුණපාල විතානගේ මහතා

❖ එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා මෙම බටහිර ස්වර සංකේත පිළිබඳ හැදෑරීමට කියවීම් පත්‍රිකාව උපයෝගී කර ගන්න.

<u>කියවීම් පත්‍රිකාව</u>

Treble Clef සංකේතය



Bass Clef සංකේතය



Rest Marks පෙරදිග සංගීත ප්‍රස්තාරවල යම්කිසි මාත්‍රා සංඛ්‍යාවක් නිශ්ශබ්ද බව දැක්වීමට එම මාත්‍රා ගණනට අනුරූප වන සේ + ලකුණු යොදනු ලැබේ.මාත්‍රා දෙකක් නිශ්ශබ්ද වන්නේ නම් + + ලකුණු දෙකක් යෙදීම ආදී වශයෙන් ය.බටහිර සංගීතයේ දී නිශ්ශබ්ද මාත්‍රා සංඛ්‍යාවක් හඟවන සංකේත Rest Marks ලෙස නම් කරනු ලැබේ.බටහිර සංගීතයේ දී නිශ්ශබ්ද ව සිටිය යුතු එක් එක් මාත්‍රා සංඛ්‍යාවන් දැක්වීමට වෙනවෙන ම සංකේත ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
|  | Semi Breeve Rest | මාත්‍රා 4ක් නිශ්ශබ්ද බව දැක්වීම |  | Dotted Semi Breeve Rest | මාත්‍රා 6ක් නිශ්ශබ්ද බව දැක්වීමට පසුපසින් තිතක් තබනු ලැබේ. |




මෙම සංකේත ප්‍රස්තාරයක යෙදෙන අයුරු




## Tie Mark ඇඳීමේ ලකුණු

පෙරදිග ප්‍රස්තාරයක කිසියම් මාත්‍රා සංඛ්‍යාවක් ඇදෙන තැනක දී එම මාත්‍රා සංඛ්‍යාවට අනුරූප ව කඩ ඉරි යොදනු ලැබේ.මාත්‍රා 4 ක් ඇදෙන්නේ නම් " ස--- "ආදී වශයෙනි.බටහිර සංගීතයේ දී මෙවැනි මාත්‍රා සංඛ්‍යාවන් ඇදෙන බව දැක්වීමට වෙන වෙන ම සංකේත භාවිත කෙරේ.එවැනි අවස්ථාවක දී ඊළඟ විභාගයේ හෝ සංකේතයේ හෝ මාත්‍රා සංඛ්‍යාවක් එක් කර ගැනීමට අවශ්‍ය නම් Tie ලකුණ යොදනු ලැබේ.






5.මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

- බටහිර සංගීත ප්‍රස්තාරයක භාවිත වන සංකේත කිහිපයක් පැහැදිලි කරයි.
- එම සංකේත ලියා දක්වයි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේදී අවශ්‍යතාව පිළිගනියි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි.

6.ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති :

1.පහත දැක්වෙන පෙරදිග ස්වර කොටස් නියමිත සංකේත යොදා බටහිර ක්‍රමයට ප්‍රස්තාර කරන්න.

i. + ස රි ග /+ රි ග ම/+ ග ම ප / + ම ප ධ

ii. + + + + / + +රි - / + රි රි රි / +රි +ම-- + +

iii. . + + + + / + + ම - / + ධ ධ ප / +ප +ම +ග + +

පාඩම සැකසුම : නිවිතිගල අධ්‍යාපන කලාපය

සෞන්දර්ය අංශය